# ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

**2026 ලෝක ජනාවාස දින පාසල් චිත්‍ර / රචනා තරගය**

2026 ඔක්තෝබර් මස 05 වෙනි දිනට යෙදී ඇති ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පැවැත්වෙන චිත්‍ර හා රචනා තරග සඳහා දිවයිනේ සියලුම පාසල් ශිෂ්‍ය / ශිෂ්‍යයාවන්ට මෙයින් ආරාධනා කරනු ලැබේ.

**ඔබේ නිර්මාණ සඳහා පදනම් කර ගත හැකි විෂය ක්ෂේත්‍රය**

- ❖ "මගෙ ලස්සන පුංචි ගෙදර"
  (සතුට, සාමය, නිදහස, පිරුණු ලස්සන ජීවිතයක් වෙනුවෙන් ආදායමට සරිලන පරිදි තමන්ට ගැලපෙන ලස්සන පුංචි ගෙදරක් සඳහා වන ඔබේ අදහස නිර්මාණයට ඇතුළත් කරන්න)

**තරග සහභාගීත්වය :**

රජයේ පාසලක හෝ පෞද්ගලික පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ට මෙම තරග සඳහා සහභාගී විය හැකිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කරන නිලධාරීන්ගේ දරුවන්ට මෙම තරග සඳහා සහභාගී විය නොහැකි ය.

.............................................................................................................................................

**පාසල් චිත්‍ර තරගය**
**තරග කාණ්ඩ**

| | |
|---|---|
| පළමු කාණ්ඩය | - 03, 04 සහ 05 ශ්‍රේණි |
| දෙවන කාණ්ඩය | - 06, 07 සහ 08 ශ්‍රේණි |
| තෙවන කාණ්ඩය | - 09 සහ 10 ශ්‍රේණි |
| සිව්වන කාණ්ඩය | - 11, 12 සහ 13 ශ්‍රේණි |

**නිර්මාණ ඉදිරිපත් කිරීම**

චිත්‍ර තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණ අඟල් 17 x 22 ප්‍රමාණයේ කඩදාසියක නිර්මාණය කළ යුතු වේ.

මෙම චිත්‍රය නිර්මාණය කිරීම සඳහා පැස්ටල්, දියසායම්, පැන්සල් වැනි ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය. **( මෙම කොන්දේසි සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

..............................................................................................................................

**පාසල් රචනා තරගය**
**තරග කාණ්ඩ**

| | | |
|---|---|---|
| පළමු කාණ්ඩය | - | 06, 07 සහ 08 ශ්‍රේණිය<br>(වචන 300 ක උපරිමයකට යටත්ව) |
| දෙවන කාණ්ඩය | - | 09 සහ 10 ශ්‍රේණිය<br>(වචන 500 ක උපරිමයකට යටත්ව) |
| තෙවන කාණ්ඩය | - | 11, 12 සහ 13 ශ්‍රේණි<br>(වචන 500 ක උපරිමයකට යටත්ව) |

**නිර්මාණ මාධ්‍ය**

1. සිංහල මාධ්‍ය
2. දෙමළ මාධ්‍ය

**නිර්මාණ ඉදිරිපත් කිරීම**

පළමු කාණ්ඩය - අයදුම්කරුවන් වචන 300ක උපරිමයකට යටත් ව රචනා ඉදිරිපත් කළ යුතු ය.
දෙවන කාණ්ඩය - අයදුම්කරුවන් වචන 500ක උපරිමයකට යටත් ව රචනා ඉදිරිපත් කළ යුතු ය.
තෙවන කාණ්ඩය - අයදුම්කරුවන් වචන 500ක උපරිමයකට යටත් ව රචනා ඉදිරිපත් කළ යුතු ය.

**ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග**

සියලු තරගවල අවසාන ජයග්‍රාහකයින් හට පහත සඳහන් අයුරින් ත්‍යාග පිරිනැමේ.

**ප්‍රථම ස්ථානය**

**රුපියල් 15,000/- ක් , කුසලානයක් සහ සහතිකපතක්**

**දෙවන ස්ථානය**

**රුපියල් 12,500/- ක් , කුසලානයක් සහ සහතිකපතක්**

**තෙවන ස්ථානය**

**රුපියල් 10,000/- ක් , කුසලානයක් සහ සහතිකපතක්**

**කුසලතා ත්‍යාග**

**රුපියල් 3,000/- ක් බැගින් වූ කුසලතා ත්‍යාග 10ක් සහ සහතික පත් 10 ක්**

**ත්‍යාග ප්‍රදානය**

ජයග්‍රාහකයන්ට හිමි ත්‍යාග 2026 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පැවැත්වෙන ජාතික උත්සවයේ දී ප්‍රදානය කෙරේ.

**අයදුම්පත් සමඟ නිර්මාණ ඉදිරිපත් කිරීම**

සියලු අයදුම්කරුවන් ඒ සඳහා නියමිත අයදුම්පත සමඟින් ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණ ඔබගේම නිර්මාණයක් බවට ඔබ ඉගෙනුම ලබන විද්‍යාලයේ, විද්‍යාල්පති විසින් සහතික කරවාගෙන 2026 සැප්තැම්බර් මස 15 වන දිනට ප්‍රථමව තැපෑලෙන්, පෞද්ගලිකව හෝ පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු වේ (නිවාස සංවර්ධන අධිකාරියට අයත් දිස්ත්‍රික් කාර්යාලවලටද ගෙනවිත් භාරදිය හැකිය). අයදුම්පත්‍රය රහිතව ඉදිරිපත් කෙරෙන නිර්මාණ භාර ගනු නොලැබේ. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ලෝක ජනාවාස දිනය 2026 - නිර්මාණ" යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඉහත සඳහන් තරග සඳහා ඉදිරිපත් කරන සියලු නිර්මාණ සඳහා අයදුම්පත් පහත සඳහන් ලිපිනයෙන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල වෙතින් හෝ www.nhda.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි වේ.

ලිපිනය - **සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක) ,**
**තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය ,**
**07 වන මහල ,**
**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ,**
**චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත ,**
**කොළඹ - 02 .**

**දුරකතන අංක ඃ 011-2447038 / 011-2389513 / 0112-447207**

# 2026 ලෝක ජනාවාස දිනය.

**පාසල් චිත්‍ර / රචනා තරගය සඳහා අයදුම්පත**

**සහභාගී වන තරගය කාණ්ඩය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) ඃ --------------------------------------------------------
--------------------------------------------------------------------------------------------------------
2. සහතික පත්‍රයේ සම්පූර්ණ නම සඳහන් විය යුතු ආකාරය (ඉංග්‍රීසියෙන්) ඃ ----------------------------
--------------------------------------------------------------------------------------------------------
3. ශ්‍රේණිය ඃ ------------------------------------------------------------------------------------------
4. ඉගෙනුම ලබන පාසල ඃ --------------------------------------------------------------------------
5. පාසල අයත් දිස්ත්‍රික්කය හා දුරකතන අංකය ඃ --------------------------------------------------------
6. පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ඃ ---------------------------------------------------
7. භාරකරුගේ නම සහ දුරකතන අංකය ඃ ---------------------------------------------------------------
8. උපන්දිනය ඃ ---------------------------------------------------------------------------------------
9. 2026 අගෝස්තු මස 01 දිනට වයස අවුරුදු ඃ ----------------------------------------------------------

මෙම අයදුම්පත් සමඟින් ඉදිරිපත් කොට ඇති චිත්‍රය / රචනාව මා විසින් නිර්මාණය කරන ලද චිත්‍රයක්/ රචනාවක් බව මෙයින් සහතික කරන අතර, අදාළ චිත්‍ර / රචනා තරගාවලියේ සියලු තරග කොන්දේසිවලට යටත්ව ඉදිරිපත් කොට ඇති අතර, එකී තරගයේ විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම තීරණයකට මා එකඟ බව මෙයින් දන්වනු කැමැත්තෙමි.

------------------------------------

අත්සන

දිනය ඃ ------------------------

------------------------------------------------------- විසින් මෙම අයදුම්පත සමඟින් ඉදිරිපත් කර ඇති චිත්‍රය / රචනාව නිර්මාණය කොට ඇති බවත්, ඉහත අයදුම්පතෙහි ඉදිරිපත් කොට ඇති සියලු තොරතුරු සත්‍ය බවත්, මෙයින් සහතික කරමි.

---------------------------

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය ඃ -------------------------

සැලකිය යුතුයි - (මෙම අයදුම්පත නිර්මාණවල පසුපිටේ ඇලවීමෙන් නිර්මාණයට හානි සිදුවේ. එබැවින් එවැනි නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට සිදුවන අතර **අයදුම්පත නිර්මාණයට අමුණා එවීමට කටයුතු කරන්න**)